# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 6 දරන
# පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 අප්‍රේල් මස 06 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1994 අප්‍රේල් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

**කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.**

මිල : රු. 1.20 ශ. තැපැල් ගාස්තුව : රු. 1.00 ශ.

## 1994 අංක 6 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 අප්‍රේල් මස 06 වන දින]

**එල්. ඩී.—ඕ. 52/87**

### 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

පළිබෝධ නාශක ආනයනය කිරීම, ඇසිරීම, ලේබල් කිරීම, ගබඩා කිරීම, සංයෝග සකස් කිරීම, ප්‍රවාහනය, විකිණීම සහ භාවිතා කිරීම ඇතුළුව පළිබෝධ නාශක කර්මාන්තය ආණ්ඩුව විසින් පාලනය කිරීම මහජන යහපත පිණිස වන බව පාර්ලිමේන්තුව විසින් සලකනු ලබන හෙයින් :—

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 1994 අංක 6 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1980 අංක 33 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ දීර්ඝ නාමයෙහි ඇති "පළිබෝධ නාශක ජිති කමිටුවක්" යන වචන වෙනුවට "පළිබෝධ නාශක තාක්ෂණික හා උපදේශක කමිටුවක්" යන වචන ආදේශ කිරීමෙන් එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

> "පනත අදාළ කිරීම.
>
> 2. මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති පිළිදි වූ සංයෝගවලට හැර සක්‍රිය රස ද්‍රව්‍යවලට සහ සහකාරක ද්‍රව්‍ය සහිත පළිබෝධ නාශක සංයෝගවලට මේ පනත අදාළ වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) පනතේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පළිබෝධ නාශක සහකාර රෙජිස්ට්‍රාර්වරුන් යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය.

(4) සෑම පළිබෝධ නාශක සහකාර රෙජිස්ට්‍රාර්වරයකු විසින් ම, පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල සියල්ලම හෝ ඉන් යම් බලයක් ක්‍රියාත්මක කළ හැකි අතර, එම බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඔහු රෙජිස්ට්‍රාර්වරයාගේ පාලනය සහ විධානයට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(1) (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පළිබෝධ නාශක තාක්ෂණික හා උපදේශක කමිටුවක් තිබිය යුතු ය ;

(2) ඒ කමිටුව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන් ගෙන් ; එනම් :

(i) (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නිලධරයෙක් ;

(ii) (මෙහි මින් මතු "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නිලධරයෙක් ;

(iii) රජයේ රස පරීක්ෂකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නිලධරයෙක් ;

(iv) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නිලධරයෙක් ;

(v) කම්කරු කොමසාරිස්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නිලධරයෙක් ;

(vi) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නිලධරයෙක් ;

(vii) (439 වන අධිකාරය වූ) රබර් පර්යේෂණ ආඥා පනත යටතේ පිහිටුවන ලද රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නිලධරයෙක් ;

(viii) 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සභාපතිවරයා විසින් නම් කරන ලද ඒ ආයතනයේ සාමාජිකයෙක් හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නිලධරයෙක් ;

(ix) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරන ලද යම් නිලධරයෙක් ;

(x) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පිහිටුවන ලද මධ්‍යම පාරිසරික අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරන ලද ඒ අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ; සහ

(ආ) පළිබෝධ නාශක භාවිත කිරීමේ, පළිබෝධ නාශක පාලනය කිරීමේ සහ අදාළ විද්‍යාත්මක උපක්‍රම පිළිබඳ පළපුරුද්දක් ඇති, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු පස් දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් :

එසේ වුව ද, පළිබෝධ නාශක නිෂ්පාදනය කිරීමෙහි, ආනයනය කිරීමෙහි, අලෙවි කිරීමෙහි, සංයෝග සකස් කිරීමෙහි, ගබඩා කිරීමෙහි, ප්‍රවාහනය කිරීමෙහි හෝ විකිණීමෙහි ලා වාණිජමය සම්බන්ධතාවක් ඇත්තා වූ කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබිය යුතු ය. ".

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

" පළිබෝධ නාශක තාක්ෂණික හා උපදේශක කමිටුව. ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) කමිටුවේ කර්තව්‍ය—

(අ) පළිබෝධ නාශක ලියාපදිංචි කිරීමට, ඇසුරුම් අනාමත යට, ගබඩා කිරීමට, සංයෝග සකස් කිරීමට, අපනයනය කිරීමට, විකිණීමට සහ පළිබෝධ නාශක භාවිතයට අදාළ යම් වැදගත් කාරණයක් පිළිබඳව සහ නියම කරනු ලැබිය හැකි පරිදි ඒවාට අදාළ වෙනත් යම් කාරණයක් පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයාට උපදෙස් දීම ;

(ආ) එහි කර්තව්‍ය ඉටු කිරීම පිණිස ඒ කමිටුවට සහායවීම පිණිස තාක්ෂණික අනුකමිටු පත් කිරීම

විය යුතු ය ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි ඇති "කමිටුවේ සියලු සාමාජිකයන් පැමිණ සිටින රැස්වීමකදී" යන වචන වෙනුවට "කමිටුවේ රැස්වීමක දී" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) සක්‍රීය රස ද්‍රව්‍යවල කාර්මික ශ්‍රේණිය සාදන්නාගේ නම සහ ලිපිනය ද, එසේම ඒ ඉල්ලීම කරනු ලබන්නේ යම් පළිබෝධ නාශක සංයෝගයක් සම්බන්ධයෙන් ද එම පළිබෝධ නාශක සංයෝගය නිෂ්පාදනය කරන්නාගේ නම සහ ලිපිනය ;";

(ii) ඒ උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඊ) ඒ පළිබෝධ නාශකයේ ප්‍රයෝජන, ශක්තිය ගබඩා කර තිබීමේ දී එහි ස්ථාවරභාවය සහ පාවිච්චි කළ හැකි කාලය සම්බන්ධයෙන් එම පළිබෝධ නාශකය සාදන්නා හෝ නිෂ්පාදකයා කියා සිටින කරුණු පිළිබඳ ප්‍රකාශයක් සහ සාක්ෂි වශයෙන් යම් පරීක්ෂණයක ප්‍රතිඵලවලින් සනාථ කරන එම පළිබෝධ නාශකයේ සඵලත්වය සහ වගාව ආරක්ෂා කිරීමේ ගතිගුණ සම්බන්ධයෙන් වූ ප්‍රකාශයක් ;"; සහ

(iii) ඒ උපවගන්තියේ (උ), (ඌ), (එ) සහ (ඒ) යන ඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(උ) ඒ පළිබෝධ නාශකයේ සංයෝගය සකස් කරනු ලැබ ඇත්තේ යම් කාර්මික ශ්‍රේණියේ ද්‍රව්‍යයකින් ද, ඒ කාර්මික ශ්‍රේණියේ ද්‍රව්‍යයෙහි රසායනික හා භෞතික ගතිගුණ ද ඒ පළිබෝධ නාශකයේ ශුද්ධ බර ද, සමාවයවිත අපවිත්‍ර ද්‍රව්‍යයන්ගේ සහ වෙනත් අතුරු නිෂ්පාදනවල අනන්‍යතාව හා ප්‍රමාණය ද ඇතුළුව, ඒ පළිබෝධ නාශකයේ සංයුතිය හා එහි රසායනික අනන්‍යතාව දැක්වෙන ප්‍රකාශයක් ;

(ඌ) නිර්දේශ කරන ලද පරිදි පළිබෝධ නාශකයක් පරිහරණයට ගත්විට, එමගින්, එසේ පරිහරණයට ගන්නා තැනැත්තාට හෝ පළිබෝධ නාශක යොදනු ලැබූ වගාවන් පරිභෝජනය කරන තැනැත්තන්ට අයෝග්‍ය ප්‍රතිඵල සිදු නොවිය හැකි බව පෙන්වීම සඳහා පළිබෝධ නාශකයේ ප්‍රතිඵලය සම්බන්ධයෙන් වූ තොරතුරු ඇතුළුව. ඒ පළිබෝධ නාශකය පිළිබඳ ප්‍රමාණවත් විෂ විද්‍යාත්මක දත්ත ;

(එ) සාක්ෂි වශයෙන් විශ්ලේෂණයේ ප්‍රතිඵල සහිතව සකස් කරන ලද පළිබෝධ නාශක සංයෝගය විශ්ලේෂණය කරන ක්‍රම ; සහ

(ඒ) සාක්ෂි වශයෙන් යම් පරීක්ෂණවල ප්‍රතිඵල සහිතව, නියම කරන ලද පරිදි පළිබෝධ නාශක යෙදීමෙන් පසු ආහාරවල හා සත්ව ආහාරවල ඇති පළිබෝධ නාශකයේ අවශිෂ්ටයන් නිශ්චය කිරීමේ ක්‍රම ; ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) සහ (ආ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (අ) පළිබෝධ නාශකය ලියාපදිංචි කර අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා වලංගු බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) පළිබෝධ නාශකය තාවකාලිකව ලියාපදිංචි කර, බලපත්‍රයක් නිකුත් කරනු ලබන තුරු හෝ බලපත්‍රයක් නිකුත් කරනු වෙනුවට, මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා වලංගු තාවකාලික අවසර පත්‍රයක් ඒ අවසර පත්‍රයේ නිශ්චිතව දැක්වෙන කොන්දේසිවලට අනුකූලව පළිබෝධ නාශකය සීමාසහිත ලෙස විකිණීම හා පාවිච්චි කිරීම සඳහා නිකුත් කරනු ලැබිය යුතුය ; ".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) ඉල්ලීම සමග ඉදිරිපත් කරන ලද ලේබලයේ පිටපතෙහි පහත දැක්වෙන විස්තර සිංහල හා දෙමළ යන භාෂාවලින් ඇත්නම් මිස, 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය. එනම්—

(අ) පළිබෝධ නාශකය විකිණිය යුත්තේ කවර වෙළෙඳ නාමයක් යටතේ ද යන වග සහ එය පාවිච්චි කිරීමේ ප්‍රභේද ;

(ආ) පළිබෝධ නාශකයේ වෙළෙඳ නාම සඳහා යොදන ලද අකුරුවල ප්‍රමාණයෙන් අඩකට වඩා කුඩා නොවූ ප්‍රමාණයක අකුරුවලින් සහ වෙළෙඳ නාමය සමගම ඊට පහළින් ඒ පළිබෝධ නාශකයේ සක්‍රීය රස ද්‍රව්‍යවල පොදු නාම ;

(ඇ) ඝනයක් වන අවස්ථාවක ප්‍රකාශ කෙරෙන සියලු සක්‍රීය ද්‍රව්‍යවල අඩංගු දේ ප්‍රතිශතයක් හෝ කිලෝග්‍රෑම් එකක ඇති ග්‍රෑම් ප්‍රමාණයක් වශයෙන් ද ඒ දෙය ද්‍රවයක් වන අවස්ථාවක ලීටරයක ඇති ග්‍රෑම් ප්‍රමාණයක් වශයෙන් ද ;

(ඈ) බලපත්‍රය දරන්නාගේ නම සහ ලිපිනය ;

(ඉ) පළිබෝධ නාශකය යටතේ අවසන් වරට යෙදීමෙන් පසු පළිබෝධ නාශකය එසේ යොදනු ලැබූ වගාවේ අස්වැන්න ලබා ගැනීම හා අලෙවි කිරීම සඳහා ඉකුත් විය යුතු කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් වූ තොරතුරු හා උචිත යයි රෙජිස්ට්‍රාර්වරයා සලකන අවස්ථාවක, පළිබෝධ නාශකයේ ගබඩාගත ජීව කාලය ද ඇතුළුව, පළිබෝධ නාශක පාවිච්චි කළ යුතු ආකාරය පිළිබඳව ප්‍රමාණවත් උපදෙස් ;

(ඊ) ප්‍රථමාධාර සහ ප්‍රතිගරල තොරතුරු ඇතුළුව ප්‍රමාණවත් අන තුර ඇඟවීමේ සහ හානි වැළැක්වීමේ සංකේත හා ප්‍රකාශ අවශ්‍ය විටක මේ පිළිබඳව විස්තරාත්මක උපදෙස් සමග සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් යුත් කුඩා පත්‍රිකා වක් අතිරේක වශයෙන් ඇසුරුමට ඇතුළත් කිරීමෙන් ;

(උ) පළිබෝධ නාශකය සඳහා මේ පනත යටතේ බලපත්‍රය දී ඇති බව දැක්වෙන නිල සංකේතයක් විය යුතු " ලියාපදිංචි කරන ලදී " යන වචන සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ පළිබෝධ නාශකය සඳහා දෙන ලද බලපත්‍ර අංකය ;

(ඌ) මේ පනත යටතේ නියෝග මගින් නියම කරනු ලබන වෙනත් යම් විස්තර :

එසේ වුවද ඊට අතිරේකව (අ), (ආ) සහ (ඊ) ඡේදවල විස්තර ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" අනුමත කරන ලද පළිබෝධ නාශක.

**9.** 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඔහු විසින්—

(අ) ඒ පළිබෝධ නාශකය අනුමත කරන ලද පළිබෝධ නාශකයක් ලෙස ප්‍රකාශ කළ යුතු ය ;

(ආ) ඒ පළිබෝධ නාශකය සීමා කරන ලද, සාමාන්‍ය හෝ ගෘහාශ්‍රිත පළිබෝධ නාශකයක් ලෙස වර්ග කළ යුතු ය. ".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ ඇතුළත් වන " ඒ පළිබෝධ නාශකය බහා ඇත්තේ අනුමත කරන ලද භාජනයක " යන වචන වෙනුවට " ඒ පළිබෝධ නාශකය බහා ඇත්තේ අනුමත කරන ලද කාන්දු වාරක භාජනයක " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ අතුරු වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

" එසේ වුවද පහත සඳහන් අවස්ථාවලට, එනම්,—

(i) යම් වසංගතයක් හෝ කෘමින් පැතිරීමක් මැඩ ලීමේ කාර්ය සඳහා කමිටුවේ නිර්දේශ මත යම් පළිබෝධ නාශකයක් ආනයනය කරනු ලැබූ අවස්ථාවක ; සහ

(ii) අනුමත කරන ලද යම් පර්යේෂණ සංවිධානයක් විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමතය ඇතිව පර්යේෂණ කාර්යය සඳහා යම් පළිබෝධ නාශක හෝ පළිබෝධ නාශක සංයෝග හෝ යම් නිශ්චිත ප්‍රමාණයක් සඳහා ආනයනය කරනු ලබන අවස්ථාවක

මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය. ".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ඇතුළත් වන " ස්වකීය දෙපාර්තමේන්තුවේ නිලධරයන් සංඛ්‍යාවක් " යන වචන වෙනුවට " කෘෂිකර්ම නිලධරයන් යම් සංඛ්‍යාවක් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්—

" (ආආ) 14 වන වගන්තිය හෝ 21අ වගන්තිය උල්ලංඝනය කරමින් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇති පළිබෝධ නාශකවල ලැයිස්තුවක් සකස් කොට ඒ ලැයිස්තුවේ පිටපත්, ඒ පළිබෝධ නාශක විකුණන තැනැත්තාට හෝ ඔහුගේ නියෝජිතයාට සහ රෙජිස්ට්‍රාර්වරයාට භාරදීමෙන් පසුව, ඒ පළිබෝධ නාශක, මේ පනත යටතේ නඩු පැවරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් කාලසීමාවක් සඳහා තහනමට ගෙන රඳවා තබා ගැනීම ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 21අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" සහතිකයක් නොමැතිව විකිණීම තහනම් කිරීම.

21අ. (1) බලයලත් නිලධරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක බලය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් යම් පළිබෝධ නාශකයක් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන කුමක් වුවද, යම් තැනැත්තකු විසින් සහතිකයක් ලබා නොගෙන යම් ගෘහාශ්‍රිත පළිබෝධ නාශකයක් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම කළ හැකි ය.

(3) සහතිකයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම නියම කරනු ලබන යම් ආකෘතියක බලයලත් නිලධරයකු වෙත කරනු ලැබිය යුතු ය.

(4) විකිණීම සඳහා දෙනු ලබන සෑම සහතිකයක් ම—

(අ) නියමිත ආකෘතියෙහි විය යුතු ය ;

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුව හොත් මිස, එය නිකුත් කරන ලද දිනයේ සිට මාස දොළහක කාල සීමාවක් සඳහා බලාත්මක විය යුතු ය.

(5) (1) වන උපවගන්තියෙහි සහතිකය පළිබෝධ නාශක විකුණනු ලබන ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) (අ) 6 වන වගන්තිය යටතේ පළිබෝධ නාශකයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම ; හෝ

(ආ) 7 වන වගන්තිය යටතේ පළිබෝධ නාශකයක් සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම ; හෝ

(ඇ) 21අ වගන්තිය යටතේ පළිබෝධ නාශකයක් විකිණීම සඳහා සහතිකයක් ලබා ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම ; සහ

(ඇ) යම් ප්‍රතික්ෂේප කිරීමකට, අවලංගු කිරීමකට, අත්හිටුවීමකට, ආපසු ගැනීමකට හෝ පූර්ණ වශයෙන් වෙනස් කිරීමකට විරුද්ධව 13 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක් ම

මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලබන යම් ගාස්තුවක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි ඇතුළත් වන “අවුරුදු දෙකකට නො අඩු කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට ඒ සෑම තැනැත්තකුම යටත් විය යුතු ය.” යන වචන වෙනුවට “අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ සෑම තැනැත්තකුම යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 24අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

“නඩු පැවරීමට සහ නඩු කටයුතු මෙහෙය වීමට බලයලත් තැනැත්තෝ.

24අ. (1) සැකයක් ඇතිවීම දුරු කිරීම පිණිස, මේ පනත යටතේ වූ වැරදි සඳහා නඩු පැවරීමට සහ නඩු කටයුතු මෙහෙයවීමට රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් ආහාර පරීක්ෂකවරයකුට, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට, ග්‍රාම නිලධාරියකුට, කම්කරු පරීක්ෂකවරයකුට හෝ යම් රජයේ නිලධරයකුට බලය තිබෙන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට—

(අ) පළිබෝධ නාශක ඇසිරීම මේ පනතේ විධිවිධානවලට අනුකූලව සිදු කර තිබේ ද යන වග ;

(ආ) යම් තැනැත්තකු විසින් 16 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කර ඇත්තේ ද යන වග ;

(ඇ) සෑම වෙළෙන්දකු විසින් ම විකිණීම සඳහා සහතිකයක් ලබාගෙන තිබේ ද යන වග

නිසැකව දැන ගැනීමට බලය ඇත්තේ ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වන බල තල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා (1) වන උප වගන්තිය යටතේ බලය දෙන ලද සෑම නිලධරයකුට ම, ප්‍රමාණවත් දැනුම්දීමකින් පසු, මේ පනත යටතේ වූ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහිලා දවසේ සියලු සාධාරණ කාලවේලාවන් තුළ දී යම් ස්ථානයකට ඇතුළු විය හැකි ය. ඒ ඇතුලුවීම හේතු කොට ගෙන මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන, ඒ ඇතුල්වීමෙන් පසුව ඒ ස්ථානයෙහි සද්භාවයෙන් කරන ලද කිසිවක් හේතු කොට ගෙන ඒ නිලධරයා වගකිව යුතු නොවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(i) ඒ උපවගන්තියේ (v) වන ඡේදයෙහි ඇති "පළිබෝධ නාශක සංයෝගයක් වශයෙන් නම් කිරීම; සහ" යන වචන වෙනුවට "පළිබෝධ නාශක සංයෝගයක් වශයෙන් නම් කිරීම;" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපවගන්තියේ (vi) වන ඡේදයෙහි ඇති "පළිබෝධ නාශක භාවිත කිරීමේ ක්‍රමය සහ ආකාරය" යන වචන වෙනුවට "පළිබෝධ නාශක විකිණීමේ හා භාවිත කිරීමේ ක්‍රමය සහ ආකාරය; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපවගන්තියේ (vi) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් —

"(vii) මහජන සෞඛ්‍යයට හානිකර යයි සලකනු ලබන යම් පළිබෝධ නාශකයක් ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම තහනම් කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(i) "බලයලත් විශ්ලේෂක" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්:—

"බලයලත් විශ්ලේෂක" යන්නෙන්, ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා, ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂකවරයා, ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂකවරයකු, ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරයකු, ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂකවරයකු, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම

කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ රසායන විද්‍යාඥයා, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ විශ්ලේෂකවරයකු, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විශ්ලේෂක වරයකු සහ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු අදහස් වේ";.

(ii) "බලයලත් විශ්ලේෂක" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

"ගෘහාශ්‍රිත පළිබෝධ නාශකය" යන්නෙන්, සක්‍රිය රස ද්‍රව්‍යවල විෂගතිය පහල මට්ටමක පවත්නා වූ හෝ ඒ සක්‍රිය රස ද්‍රව්‍ය ඉතා පහළ මට්ටමකින් තිබෙන්නා වූ සහ සාමාන්‍ය භාවිතයේ දී උපද්‍රවකාරී නොවිය හැකි පළිබෝධ නාශක සංයෝගයක් අදහස් වේ ;

"සාමාන්‍ය පළිබෝධ නාශකය" යන්නෙන්, සීමා කරන ලද පළිබෝධ නාශකයක් හෝ ගෘහාශ්‍රිත පළිබෝධ නාශකයක් වශයෙන් වර්ග කර ඇති පළිබෝධ නාශකයක් නොවන පළිබෝධ සංයෝගයක් අදහස් වේ ;

(iii) "පළිබෝධය" යන්නෙහි අර්ථ කථනයෙහි ඇති "මනුෂ්‍යයාගේ බහිස්පරපෝෂිතයන් සහ සත්වයන්ගේ අන්තඃපරපෝෂිතයන්" යන වචන වෙනුවට "මනුෂ්‍යයාගේ බහිස්පරපෝෂිතයන් හා අන්තඃපරපෝෂිතයන් සහ ගෘහ සත්වයන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(iv) "පළිබෝධ නාශක සංයෝග" යන්නෙහි අර්ථකථනයෙහි ඇති "මේ පනත යටතේ සාදන ලද නියෝග විසින් එසේ නම් කරන ලද සමාන නිෂ්පාදනයක් ද ඊට ඇතුළත් වේ;" යන වචන වෙනුවට " මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නම් කරන ලද සමාන නිෂ්පාදනයක් ද ඊට ඇතුළත් වන නමුත් ෆෙරමොන් ඊට ඇතුළත් නොවේ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(v) "පළිබෝධ නාශක සංයෝග" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය එකතු කිරීමෙන් :—

"සීමාකරන ලද පළිබෝධ නාශකය" යන්නෙන් මනුෂ්‍ය සෞඛ්‍යය කෙරෙහි, නිශ්චිත ඉලක්ක රහිත ප්‍රාණ වස්තු කෙරෙහි සහ පරිසරය කෙරෙහි අහිතකර විපාක ඇතිකර විය හැකි සහ එය පරිහරණය කිරීමේ විලාසය හෝ භාවිත කිරීම හෝ බෙදා හැරීම සම්බන්ධයෙන් සීමා කිරීම් පනවා ඇති පළිබෝධ නාශක සංයෝගයක් අදහස් වේ.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ අගට පහත දැක්වෙන අලුත් උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් උපලේඛනයක් එකතු කිරීම.

“ උපලේඛනය (2 වන වගන්තිය)

නැප්තලින්

පැරඩික්ලෝරොබෙන්සීන්

ගෘහසත්වාරක්ෂක ඇම්පූ

පළිබෝධ පාලන උපාංග සඳහා විෂ රහිත ග්‍රීස් ”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

20. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

---

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, පොල්හේංගොඩ මාවත, අංක 256, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර අගය මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.